සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவமாகாணசபை - Sabaragamuwa Provincial Council
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்விதகவல்தொழில்நுட்பம்மற்றும்கலாச்சாரநடவடிக்கைகளுக்கானஅமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

අමාත්‍යාංශ ලේකම් / Secretary – Office – 045 2223015 Residence – 045 2232985, Mobile –, Email –

කාර්යාලය / Office – නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number – MEDU/AD/05/02/01

ඔබේ අංකය / உமது இல / Your Number –

දිනය / திகதி / Date – 2024.07.24

**සියලුම පත්වීම්ලාභීන් වෙත (ඇමුණුම 01)**

**<u>සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගන්නා අධ්‍යාපනවේදී උපාධිධාරීන්හට ගුරු පත්වීම් ප්‍රදානය කිරීම - 2024.</u>**

උක්ත කරුණ යටතේ ඔබ ලබා ඇති අධ්‍යාපනවේදී උපාධියට හා ඊට අදාලව 2024.07.16 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත, ගුරු පත්වීමක් ලබා දීම සඳහා ඔබ තෝරාගෙන ඇති බව සතුටින් දන්වමි.

02. එකී පත්වීම් ලිපි ප්‍රදානය කිරීමේ උත්සවය **2024.07.26** වන **සිකුරාදා දින ප.ව. 1.30**ට **සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරවර අධිනීතිඥ නවීන් දිසානායක** මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් **රත්නපුර, නව නගරයේ පිහිටි සබරගමුව පළාත් සභා ශ්‍රවණාගාරයේ** පැවැත්වේ.

03. ඒ අනුව, ඔබට හිමි පත්වීම් ලිපිය ලබාගැනීම සඳහා **2024.07.26** දින **රත්නපුර, නව නගරයේ පිහිටි සබරගමුව පළාත් සභා ශ්‍රවණාගාරය**ට පැමිණෙන ලෙස මෙයින් ඔබට දන්වන අතර **ප.ව. 12.30** වනවිට ඔබට **හිමි ආසන අංකය අනුව අසුන් ගත යුතුය.**

04. පිරිමි පත්වීම්ලාභීන් කළු කලිසම හා සුදු කමිසය (ටයි පටියක් පැළඳ) හෝ ජාතික ඇඳුමින් සැරසී පැමිණිය යුතු අතර, කාන්තා පත්වීම්ලාභීන් සුදු හෝ ලා පැහැති ඔසරිය හෝ සාරියකින් සැරසී පැමිණිය යුතු වේ.

05. මෙදිනට සහභාගී වන ඔබ මෙම ලිපිය සහ ඔබගේ ජාතික හැඳුනුම්පත අනිවාර්යයෙන්ම රැගෙන ආ යුතු බව සැලකිය යුතුය.

06. පත්වීම් ලිපි ප්‍රදානය කෙරෙන උත්සව ශාලාවට ඔබට පමණක් පැමිණීමට අවස්ථාව හිමි වේ.

**ඉතා වැදගත් : මේ සමග අමුණා ඇති දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු වලට එකඟ වන බවට සාමවිනිසුරුවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු ඉදිරිපිටදී රු.50/- ක වලංගු මුද්දරයක් මත අත්සන් තබා එය 2024.07.26 දින රැගෙන ආ යුතුය.**

**බී.ඒ.සී.පී. බමුණුආරච්චි**
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.